# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1779/24 – 2012 ඔක්තෝබර් 11 වැනි බ්‍රහස්පතින්දා – 2012.10.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උඩුගහ පත්තුව සුළු කොට්ඨාසයේ, වඳුරාමුල්ල ගමේ පිහිටි ගම්පහ මැනුම් අධිකාරි විසින් සකස් කරන ලද අංක ගම්/අත්/04/372 හා 2005.01.11 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් කැබලි අංක 1 වූ ප්‍රමාණයෙන් හෙක්. 2.7164 ක් පමණ වූ පහත සඳහන් ප්‍රමාණයන්ගෙන් යුත් ඉඩම් කැබැල්ලට මායිම්:

**කැබලි අංක 1 – කෝන්ගස්ඕවිට නොහොත් කෝන්ගස්වත්ත – ප්‍රමාණය: හෙක්. 2.7164 ක් පමණ**

උතුරට: අත්තනගල්ල ඔය; නැගෙනහිරට: අත්තනගල්ල ඔය, සාපින් සිංඤෝ, සුවාරිස් සහ තවත් අය හිමිකම් කියන රිටිගහවලපල්ල; දකුණට: ඒ. ඒ. මෙන්ඩිස් සහ තවත් අය හිමිකම් කියන කෝන්ගස්වත්ත; බටහිරට: කරුණාපේඩිගේ පියදාස හිමිකම් කියන බුළුගහවත්ත සහ මාර්ගය.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංකය: එල්/ඩී/05/2003/පීසී/201.
2012 ජූලි මස 16 වැනි දින,
1200/6, “මිහිකත මැදුර”,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

10 - 1108

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උඩුගහ පත්තුව සුළු කොට්ඨාසයේ, උඩුගොඩ ගමේ පිහිටි ගම්පහ මැනුම් අධිකාරි විසින් සකස් කරන ලද අංක ගම්/අත්/99/261 හා 2000.11.11 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් කැබලි අක්ෂර ‘ඒ’ සිට ‘එෆ්’ දක්වා වූ ප්‍රමාණයෙන් හෙක්. 0.0296 ක් පමණ වූ පහත සඳහන් ප්‍රමාණයන්ගෙන් යුත් ඉඩම් කැබලි හය (06)ට මායිම්:

**කැබලි අක්ෂර ‘ඒ’ – කහටගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0018 ක් පමණ**

උතුරට: එස්. ඒ. වීරසිංහ හිමිකම් කියන කහටගහවත්ත; නැගෙනහිරට: එස්. ඒ. වීරසිංහ හිමිකම් කියන කහටගහවත්ත සහ ආර්. කේ. බාරොන් සිංඤෝ හිමිකම් කියන කහටගහවත්ත; දකුණට: කැබලි අක්ෂර බී; බටහිරට: පාර.

**කැබලි අක්ෂර ‘බී’ – කහටගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0059 ක් පමණ**

උතුරට: කැබලි අක්ෂර ඒ; නැගෙනහිරට: ආර්. කේ. බාරොන් සිංඤෝ හිමිකම් කියන කහටගහවත්ත සහ කැබලි අක්ෂර සී; දකුණට සහ බටහිරට: ඩබ්ලිව්. ඒ. විජේවර්ධන හිමිකම් කියන කහටගහවත්ත.

**කැබලි අක්ෂර ‘සී’ – කහටගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0003 ක් පමණ**

උතුරට: කැබලි අක්ෂර බී සහ ආර්. කේ. බාරොන් සිංඤෝ හිමිකම් කියන කහටගහවත්ත; නැගෙනහිරට: ආර්. කේ. බාරොන් සිංඤෝ හිමිකම් කියන කහටගහවත්ත; දකුණට: කැබලි අක්ෂර ඩී සහ පාර; බටහිරට: කැබලි අක්ෂර බී.

**කැබලි අක්ෂර 'ඩී' – කහටගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0059 ක් පමණ**
උතුරට සහ නැගෙනහිරට: ආර්. කේ. ගුණරත්න හිමිකම් කියන කහටගහවත්ත; දකුණට සහ බටහිරට: පාර.

**කැබලි අක්ෂර 'ඊ' – කහටගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0099 ක් පමණ**
උතුරට: කැබලි අක්ෂර බී සහ පාර; නැගෙනහිරට: පාර; දකුණට සහ බටහිරට: ඩබ්ලිව්. ඒ. මිසිනෝනා, ඩබ්ලිව්. ඒ. නෝනා හාමි, ඩබ්ලිව්. ඒ. මේලිස් සිංඤෝ සහ ඩබ්ලිව්. ඒ. පුංචිනෝනා හිමිකම් කියන කහටගහවත්ත.

**කැබලි අක්ෂර 'එෆ්' – කහටගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0058 ක් පමණ**
උතුරට: කැබලි අක්ෂර ඩී, ආර්. කේ. සිරිවර්ධන සහ ආර්. කේ. අමරතුංග හිමිකම් කියන කහටගහවත්ත; නැගෙනහිරට: ආර්. කේ. සිරිවර්ධන සහ ආර්. කේ. අමරතුංග හිමිකම් කියන කහටගහවත්ත; දකුණට: සරත් කුමාර හිමිකම් කියන කහටගහවත්ත සහ පාර; බටහිරට: පාර.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංකය: 13/99/පීසී/218.
2012 ජූලි මස 16 වැනි දින,
1200/6, "මිහිකත මැඳුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

10 - 1109

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම මෙයින් ප්‍රකාශ කරමි.

ගම්පහ දිස්ත්‍රික්කයේ අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උඩුගහ පත්තුව සුළු කොට්ඨාසයේ, වඳුරව ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක ගම්/අත්/2011/245 හා 2011.12.28 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 14.548 ක් පමණ වූ මිකාඩෝවත්ත, කොරගහලන්ද, දෙල්ගහලන්ද සහ නැදුන්ගහවත්ත නැමති ඉඩමට මායිම්:

**01. කැබලි අක්ෂර 'ඒ' – මිකාඩෝවත්ත, කොරගහලන්ද, දෙල්ගහලන්ද සහ නැදුන්ගහවත්ත – ප්‍රමාණය: හෙක්. 14.548 ක් පමණ**
උතුරට: ලංකා විදුලිබල මණ්ඩලය හිමිකම් කියන මිකාඩෝවත්ත, ආහාර දෙපාර්තමේන්තුව සතු මිකාඩෝ වත්ත, ඩී. ජී. සුසන්ත සඳරුවන් සහ තවත් අය හිමිකම් කියන වේටෙක්ස් සිටි හෝම්ස් සහ බණ්ඩාරනායක පාර; නැගෙනහිරට: බණ්ඩාරනායක පාර, නදීකා කුමාරි සහ තවත් අය හිමිකම් කියන කොරගහලන්ද, ආනන්ද ලාල් සහ තවත් අය හිමිකම් කියන නැදුන්ගහවත්ත; දකුණට: ආනන්ද ලාල් සහ තවත් අය හිමිකම් කියන නැදුන්ගහවත්ත, හිමිකරු සොයාගත නොහැකි දෙල්ගහවත්ත, යුධ හමුදාව හිමිකම් කියන මිකාඩෝ වත්ත සහ හිමිකම් කියන අය සොයාගත නොහැකි මිකාඩෝ වත්ත; බටහිරට: හිමිකම් කියන අය සොයාගත නොහැකි මිකාඩෝ වත්ත, ආහාර දෙපාර්තමේන්තුවේ ගබඩා සංකීර්ණය පිහිටා තිබෙන මිකාඩෝ වත්ත සහ ලංකා විදුලිබල මණ්ඩලය පිහිටා තිබෙන මිකාඩෝ වත්ත.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංකය: 4/3/4/2011/ඩී/06.
2012 අගෝස්තු මස 09 වැනි දින,
"මිහිකත මැඳුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

10 - 1110

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.